**ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරිය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිලිනොච්චිය ජර්මානු කාර්මික පුහුණු කිරීමේ ආයතනයට අදාලව 2018 වර්ෂයේ සිට පැවති රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන හා විලම්භිත ආදායම් ගිණුම් තැබීමේදී ඇති වී තිබුණු රු. 16,297,465 ක දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව අතීතානුයෝගීව ගැලපුම් | කිලිනොච්චි ජර්මානු කාර්මික පුහුණු කිරීමේ ආයතනය, ජර්මානු පුහුණු කිරීමේ අධිකාරියට පවරා දීමේදී වත්කම් හා වගකීම් 2021 වර්ෂයේ මූල්‍යය ප්‍රකාශනවලින් ඉවත් කිරීමේ දී වත්කම් ඉවත් කිරීමේ ලාභය ලෙස රු. 16,297,465 ක ලාභයක් පැන නැගුණු අතර එසේ ලාභයක් ඇති වීමට හේතුව සොයා බැලීමේ දී අනාවරණය වූයේ 2018 වසරේ සිට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් තැබීම සහ විලම්භිත ආදායම් (Differed Income) ගණනය කිරීම වැරදි ආකාරයට සිදු කර ඇති බව. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව අනාවරණය වූ දෝෂ අතීතයානුකූලව ගැලපීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් පැවරීමේ ලාභයක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සටහන් කිරීම නිසා එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරියට ලැබී තිබුණු රු.67,705,041 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ට අනුකූලව ගිණුම් පිළියෙල කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය දැනුම ලබා දෙන ලෙස උපදෙස් ලබා දී ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් තැබීම සිදුකළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුලදී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ධාරණ අගය රු.110,974,250 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනයෙන් අත්හැරීම හේතුවෙන් දේපල, පිරියත, උපකරණ වටිනාකම් හා ප්‍රත්‍යාගණන සංචිතය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේදී මෙම වරද ජ'නල් මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී භාවිතා කරන සියළුම වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | අධිකාරිය යටතේ පවතින කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය වෙත ඕස්ට්‍රියානු ව්‍යාපෘති අරමුදලින් ඉකුත් වර්ෂයේදී ලබාදී තිබුණු එකතුව රු.1,584,556,810 ක් වූ ගොඩනැගිලි, පුහුණු උපකරණ, අස්පෘශ්‍ය වත්කම් සහ නවීකරණය හා අධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු කිරීම වෙනුවෙන් වැයකරන ලද රු.168,937,662 ක් ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි. | 2022 වර්ෂයේදී මෙම වටිනාකම් පොත්වල ගැලපීමට කටයුතු කරනු ලබන බව. | ව්‍යාපෘති මගින් ලැබෙන සියළුම අරමුදල් හා වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | "Multi purpose Development Task Force Training Programme 100,000" ව්‍යාපෘතිය වෙනුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබී තිබුණු රු.18,770,586 ක් තැන්පත් ගිණුමක රඳවා ගැනීම වෙනුවට වර්ෂයේ ලාභයක් ලෙස හඳුනාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | රැකියා ලක්ෂයේ වැඩසටහනට (Multi-Purpose Development Task Force Training Programme) අදාලව ඇස්තමේන්තුගත වියදමට වඩා සත්‍ය වියදම අඩු වූ අවස්ථාවක එම අතිරික්තය ආපසු ගෙවන බව අධිකාරිය සහ බලකාය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුමේ (MOU) සඳහන් කර නොමැත.<br>එම ශේෂය උපයෝගී කරගෙන ව්‍යාපෘතිය වෙනුවෙන් ඉදිරියේදී දැරීමට සිදුවන වියදම් දැරිය යුතුය. | වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ඉටුකරන කාර්යයන් සඳහා ලැබෙන මුදල් තැන්පත් ගිණුමක රඳවාගෙන වියදම් දැරිය යුතුය. |
| (ඈ) | අධිකාරිය වෙත පෞද්ගලික ආයතනයකින් පරිත්‍යාග ලෙස ලැබුණු රු.1,000,000 ක මුදල අධිකාරියේ ආදායම ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට සේවක සුභසාධක අරමුදල් ගිණුමකට බැර කර තිබුණි. | කොරෝනා වසංගත තත්ත්වයට අවශ්‍ය ඇඳන් දාහක් සකස් කිරීමට අවශ්‍ය රු 1,000,000.00 ක මුදලක් අධිකාරියේ සභාපතිතුමාගේ ලිඛිත ඉල්ලීමකට අනුව පෞද්ගලික ආයතනයක් විසින් සභාපතිතුමා වෙත ලබාදී තිබුණි. අදාල කාර්යය ඉටු කිරීම සඳහා සුභ සාධක සංගමය වෙත වගකීම සභාපතිතුමා පවරා තිබූ නමුත් එම චෙක් පත අධිකාරිය නමින් නිකුත් කර තිබූ බැවින් අධිකාරියේ ගිණුමට තැන්පත් කර චෙක් පත උපලබ්ධි වූ පසු එම මුදල් නැවත සුභසාධක ගිණුමට මාරු කර කාර්යය ඉටුකරන ලෙස සභාපතිතුමා අදාල වවුචරයේ ලිඛිතව සටහන් කර උපදෙස් ලබා දී ඇති බව. | අධිකාරිය වෙත ලැබෙන සියළුම ආදායම් අධිකාරියේ ආදායම් ලෙස ගිණුම් තැබිය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුලදී ආයතන දෙකකින් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ටැබ් යන්ත්‍ර 500 ක වටිනාකම හා බස්රථයෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් පරිගණක හා මෝටර් රථ වටිනාකම සහ පරිත්‍යාග ගිණුමෙහි ශේෂය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | Tab යන්ත්‍ර 500 වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. 2022 වර්ෂයේදී අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | පරිත්‍යාග ලෙස ලැබී තිබුණු සියළුම වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | අධිකාරියේ ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයෙහි 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු. 3,351,456 ක වටිනාකමක් සහිත පාඩම්මාලා පොත් 16,235 ක් තොගය යටතේ ගිණුම්ගත කිරීම අත්හැරී තිබුණි. | 2022 අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී ගිණුම් පොත් වල ගැලපීම් කරන බව වැඩි දුරටත් දැනුම් දෙන බව. | අවසන් තොගය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ( උ) | සමාලෝචිත වර්ෂයට අදාලව එකතුව රු. 1,490,345 ක් වූ ගෙවිය යුතු පාරිතෝෂික ගිණුම්ගත කර නොතිබුණි. | 2022.12.31 දින වන විට අදාළ ගෙවිය යුතු පාරිතෝෂිත මුදල වන රු. 1,490,345 ක මුදල ජර්නල් ගත කොට ගිණුම් ගත කර එම වරද නිවැරදි කර ඇති බව. | වර්ෂයට අදාල පාරිතෝෂිත මුදල නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුලත් එකතුව රු.100,724,147 ක් වූ ලැබිය යුතු ශේෂය තුළ වර්ෂ 01 ත් වර්ෂ 16 ත් අතර අයකර නොගත් එකතුව රු.36,312,338 ක් වූ විවිධ ණයගැති ශේෂ සහ එකතුව රු. 1,116,983 ක් වූ සේවක ණයද ඇතුලත් වී තිබූ අතර මෙම ශේෂ අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | මුදල් අය කර ගැනීමට හැකියාවක් නොමැති වීමට එම සේවකයින් මේ වන විට අධිකාරියේ සේවය නොකිරීමයි. ඊට අදාළ ප්‍රතිපාදනයන් ගිණුම් පොත්වල ගලපා ඇති බව. | දිගුකාලීනව පවතින ලැබිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එකතුව රු. 198,247,374 ක් වූ ගෙවිය යුතු ශේෂය තුල වර්ෂ 02 සිට වර්ෂ 14 අතර ගෙවිය යුතු අත්තිකාරම්, තැන්පතු හා විවිධ ණයහිමියන්ගේ එකතුව රු. 83,517,427 ක් වූ අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම ශේෂයන් පිළිබඳව පරීක්ෂා කර බලා කඩිමින් නිරවුල් කිරීමට පියවර ගනු ලබන බව. | දිගුකාලීනව පවතින ගෙවිය යුතු මුදල් නිරවුල් කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ---------------------- | ----------------- | -------------------------- | ------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 65 (1) | මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදනය කරන ලද නිශ්චිත කාර්යයන් සහ මුදල් ප්‍රමාණයන් නිසි අධිකාරී බලය නොමැතිව වෙනස් නොකළ යුතු වුවද, ප්‍රාග්ධන වියදම් සඳහා ලබාදී තිබුණු රු.8,990,978 ක් කිසිදු අනුමැතියකින් තොරව පුනරාවර්තන ස්වභාවයේ වියදම් සඳහා වැයකර තිබුණි | මෙම රු. 8,990,978.00 ක මුදල අධිකාරියේ ප්‍රාග්ධන වියදම් වල කොටසක් වන Rehabilitation සඳහා යොදා ගන්නා ලද වියදමකි. එය Major Repair ලෙස වෙන්ව ගිණුම් වල හඳුනා ගැනීමක් කරන අතර 2021 වර්ෂයේ ගිණුම් ප්‍රකාශ වල නඩත්තු වියදම් ලෙස සලකා ලාභ අලාභ ගිණුම තුලින් ගලපා ඇත. | ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා ලැබෙන අරමුදල් පුනරාවර්තන වියදම් සඳහා වැය නොකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | II වැනි පරිච්ඡේදයේ 13.3 ඡේදය | වැඩ බැලීමේ පත්කිරීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්වීමක් නොපමාව කල යුතු වුවත් ආයතනයේ නිලධාරීන් 09 දෙනෙකුට මාස 08 සිට වසර 03 ක කාල පරාසයත් දක්වා වැඩ බැලීමේ පත්වීම් ලබා දී තිබුණි. | අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලයේ පවතින අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශය මඟින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත්, මේ දක්වා අදාල අනුමැතිය ලැබී නොමැත. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුව, වසරකට වැඩි කාලයක් තනතුරක වැඩ බැලීමේ පදනමින් කටයුතු කරන ලද නිලධාරීන් අදාල තනතුරෙහි රාජකාරී ඉටු කිරීම සඳහා පත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය අනුකූලව කටයුතු කළ යුතුය. |

(ඇ) චක්‍රලේඛ විධිවිධාන

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 6.1 ඡේදය | සෑම නිලධාරී කාණ්ඩයක් සඳහාම අනන්‍ය වූ නිපුණතා ඉලක්ක සපුරා ගැනීම පිණිස සෑම නිලධාරියකුටම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු කාලයක් ආවරණය වන පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කල යුතුය. ඒ අනුව පුහුණු ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම වෙනුවට එක් එක් නිලධාරියාට පෞද්ගලික වන සේ අධ්‍යක්ෂ අනුමැතිය මත නිලධාරීන් 10 දෙනකු වෙත 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය සඳහා පශ්චාත් උපාධි හා වෙනත් පාඨමාලා සඳහා රු. 1,338,537 ක් ප්‍රතිපූර්ණය කර තිබුණි. එහෙත් එම පාඨමාලා සම්පූර්ණ කල බවට කිසිදු සාක්ෂික් ලබා ගෙන නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සඳහා තොරතුරු එක්රැස් කිරීම සඳහා ආකෘති පත්‍රයක් දැනටමත් සියලු දිස්ත්‍රික් කාර්යාල හා අනෙකුත් අංශ වෙත ලබා දී ඇති බව. | සෑම නිලධාරී කාණ්ඩයක් සඳහාම සුදුසු පරිදි පුහුණු ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ii) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/ 2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුවුවද, මාස 05 ක ප්‍රමාදයකින් පසුව අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2022 නොවැම්බර් 10 දින ඉදිරිපත් කර තිබුණි. | 2021 ගිණුම් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නියමිත කාල වකවානුව තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූයේ රට තුළ පැවැති කොරෝනා වසංගත තත්ත්වයත් ආර්ථික හා දේශපාලන අස්ථාවර භාවයක් නිසා වන අතර රාජ්‍ය නිලධාරීන් සේවයට පැමිණීම සීමා කිරීමට සහ විදුලි අර්බුදය මීට ප්‍රධානතම හේතු සාධකය වූ බව.. | මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 57,777,077 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 43,708,460 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,068,617 ක පිරිහීමක් නිරීක්ෂණය විය. අනෙකුත් පුහුණු වියදම් හා පරිශ්‍රය නඩත්තු කිරීමේ වියදම් ඉහල යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 හා 2021 වර්ෂවල දුරකථන සේවා සමාගමකින් පිළිවෙලින් ටැබ් යන්ත්‍ර 450 හා 500 ක් ලැබී තිබුණු අතර කිසිඳු අනුමැතියකින් හා ප්‍රතිපත්තියකින් තොරව අධිකාරියේ විවිධ තනතුරු දරන නිලධාරීන් සඳහා එම ටැබ් යන්ත්‍ර සමග සිම්පත් බෙදාහැර තිබුණි. එමෙන්ම සේවයෙන් ඉවත් වී සිටි නිලධාරීන් 35 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු ටැබ් යන්ත්‍ර ද ආපසු ලබා ගැනීමට 2022 දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | අධිකාරියට ලැබී තිබූ Tab යන්ත්‍ර ආයතනයේ නිලධාරීන් වෙත බෙදා දීම සිදු කර ඇත්තේ අධිකාරියේ සභාපතිතුමා, උප සභාපතිතුමා සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දී තිබූ ලිඛිත අනුමැතිය යටතේ වන අතර ඊට අදාළ ලියකියවිලි ගබඩාව සතුව ඇත.<br>යම් නිලධාරියෙක් එසේ ලබා දී නොතිබුනේ නම් එම නිලධාරීන්ට ලබාදී ඇති Tab යන්ත්‍ර නැවත ලබා ගැනීම සඳහා මේ වන විට උපදෙස් ලබා දී ඇති බව. | ටැබ් යන්ත්‍ර බෙදාහැරීමේදී රාජකාරී අවශ්‍යතාව පිළිබඳ සැලකිලිමත් වියයුතු අතර සේවයෙන් ඉවත්වීමේදී නිලධාරීන් වෙත ලබාදී ඇති ටැබ් යන්ත්‍ර ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරියේ මූලික පරමාර්ථ ළඟාකර ගැනීම් සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂාවේදී 2020 හා 2021 වර්ෂවලට අදාලව ආධුනික පුහුණුකිරීම් සම්බන්ධයෙන් ළඟාකර ගැනීමට බලාපොරොත්තු වූ ඉලක්කයෙන් පිළිවෙලින් සියයට 37 හා සියයට 12ක් පමණක් ළඟාකරගෙන තිබීමත්, ආධුනික හැරයාම් පිළිවෙලින් 5119 ක් සහ 2301 ක් වූ අතර වාර්ෂිකව බඳවාගැනීම්වලින් සියයට 42 ක ආධුනික සංඛ්‍යාවක් සඳහා පමණක් සහතික පත්‍ර නිකුත් කර තිබීමත් නිරීක්ෂණය විය. | Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් රටේ වෘත්තීය පුහුණුව සඳහා පැමිණීමේ අඩුවීමක් පෙන්නුම් කළ අතර කර්මාන්ත සඳහාද නව කාර්ය මණ්ඩල පුහුණුව සඳහා ආධුනිකයන් බඳවා ගැනීමේ විශාල අඩුවීමක් පෙන්නුම් කළ බව. | වාර්ෂිකව හඳුනාගෙන ඇති ඉලක්ක වෙත ළඟා වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | හිඟ සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් වලට අදාලව ගෙවන ලද එකතුව රු.82,437,195 ක් වූ අධිභාර හා සේවකයාගෙන් අයවිය යුතු රු.58,908,280 ක් අදාල වගකිවයුතු නිලධාරීන්ගෙන් අය කිරීම | මෙම අධිකාරියේ 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල් ගණනය කිරීමේදී සේවකයින්ගේ ජීවන වියදම් දීමනාව ඇතුලත් කර නොගැනීම හේතුවෙන් හිඟ සේවක දායක මුදල් වශයෙන් රු. | සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් ප්‍රමාදයකින් තොරව ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වෙනුවට ඉකුත් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 58,908,280.00 ක් සහ අධිභාරය ලෙස රු. 82,437,195.00 ක් ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් මේ වන විට අධිකාරියේ සේවයෙන් විශ්‍රාම ගොස් ඇති බැවින් එම මුදල් ඔවුන්ගෙන් අය කිරීමේ හැකියාවක් නොමැති බව. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ප්‍රතිපත්තියකට අනුව 2020 වර්ෂයේදී හඳුනාගෙන තිබුණු නිපුණ ශිල්පීන් 100,000 ගෙන් යුත් බහු කාර්යසාධන බලකායක් පිහිටුවීමේ ව්‍යාපෘතිය සඳහා ජනාධිපති කාර්යාලයේ ප්‍රතිපාදන යටතේ 2020 හා 2021 වර්ෂයන්හි පිළිවෙලින් රු.12,470,721 ක් හා රු.51,944,364 ක් වැයකර තිබුණි. ඉන් රු. 4,650,800 ක් වැයකර තොරතුරු රැස් කිරීම සඳහා වෙනම පරිගණක පද්ධතියක් ස්ථාපිත කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විටත් අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවති අතර මෙම පාඨමාලාව සඳහා පුහුණුව ලැබූ පුහුණු ලාභීන් වෙත සහතිකපත් 32,505 ක් නිකුත් කිරීමෙන් තොරව අධිකාරියේ රඳවාගෙන තිබුණි. | රැකියා ලක්ෂයේ ව්‍යාපෘතිය යටතේ මුල් අදියරේ දී ආධුනිකයින් තිස් හතරදාහක් පමණ පුහුණුව ලැබූ අතර එම පුහුණුව ලැබූ ආධුනිකයින්ට අයත් සහතිකපත් 32,505 ක් අධිකාරිය සතුව පැවතුණි. රට තුළ පැවති දේශපාලන අස්ථාවරභාවයත්, පාලන තන්ත්‍රයේ සිදු වූ යම් යම් වෙනස්වීම් හේතුවෙන් මෙම ව්‍යාපෘතියත්, ව්‍යාපෘතියට අදාළ සහතිකපත් බෙදාදීමත් කල්ගත වූ අතර තෘතියක හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව හා රැකියා ලක්ෂයේ බලකාය හා එක්ව මෙම සහතිකපත් ආධුනිකයින් වෙත හැකි ඉක්මණින් නිකුත් කිරීමට කටයුතු කරනු ලබන බව. | පුහුණුලාභීන් වෙත සහතිකපත් කඩිනමින් ලබාදිය යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ඡේදයට හා 5.3.1 (ඇ), 4.1.1 (ඇ) වගන්තිවලට පටහැනිව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අරමුණට පරිබාහිරව විනිවිදභාවයකින් තොරව එකම අයිතිකරුවෙකුට අයත් නම් දෙකකින් | දුරකථන නාමාවලියේ සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී අයිතිකරුවන් පරීක්ෂා කිරීමේ හැකියාවක් නොමැති අතර ඒ හේතුවෙන් මෙම ආයතන අතුරින් දෙකක් එකම අයිතිකරුගේ නමින් ලියාපදිංචි වී ඇති බව තහවුරු කරගත නොහැකි වූ බව.. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි අරමුණ ඉටුවන ආකාරයට කටයුතු කළ යුතුය. |

ව්‍යාපාරික කටයුතු කරන ආයතන දෙකක් තෝරා ගනිමින් 2020 ලෝක තරුණ නිපුණතා දිනය සැමරීමේ ජාතික වැඩසටහන වෙනුවෙන් රු.1,032,930 ක් වැයකර තිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත කාර්යමණ්ඩලයට අයත් නොවන හා බඳවාගැනීමේ පරිපාටියට පටහැනි ලෙස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම යටතේ අධිකාරිය සඳහා අධ්‍යක්ෂ තනතුරකට බඳවාගෙන අධිකාරියේ අරමුණට පරිබාහිර කාර්යභාර්යක් ඉටු කරමින් සිටි නිලධාරියකු වෙත 2021 ජූලි සිට 2022 අගෝස්තු දක්වා එකතුව රු. 2,106,740 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | අධිකාරියේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලයේ ඇතුලත් තනතුරක් නොවන අධ්‍යක්ෂ තනතුරක් සඳහා එවකට කටයුතු කළ සභාපති තුමාගේ උපදෙස් අනුව පාලක මණ්ඩල අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම යටතේ නිලධාරියෙකු බඳවා ගෙන ඇත. නමුත් 2022 සැප්තැම්බර් මස සිට ඔහුගේ සේවය අවසන් කර ඇති බව. | අනුමත බඳවාගැනීමේ පටිපාටියට අනුකූලව බඳවාගැනීම් සිදු කළ යුතුය. |